# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1871/24 - 2014 ජූලි මස 15 වැනි අඟහරුවාදා - 2014.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම් කොටස, "ඇහැලියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොලිස් ස්ථානය පිහිටුවීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජූලි මස 07 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ කැන්දගමුව නගරයේ ඇහැලියගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද 1950.01.17 දිනැති අංක 691 දරන අවසාන ගම් පිඹුරෙහි කැබලි අංක 3 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසින් ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්. 0.1316 (අක්. 0, රූඩ් 3, පර්. 12.00) ක් පමණ විශාල වූ ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| කැබලි අංක 3හි කොටසක් | - | විශාලත්වයෙන් හෙක්. 0.1316 (අක්කර 00, රූඩ් 3, පර්. 12.00)ක් පමණ වූ වරිපනම් අංක 2, 2A සහ 3 දරන ගලින්දගේවත්ත දරන ඉඩම |

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 2 සහ අවසාන ගම් පිඹුරු අංක 674හි කැන්දගමුව ඉහළගම කොටසක් |
| *නැගෙනහිරට* | : | අවසාන ගම් පිඹුරු අංක 674හි කැන්දගමුව ඉහළගම කොටසක් හා කැබලි අංක 9 |
| *දකුණට* | : | කොළඹ රත්නපුර පාර සහ කැබලි අංක 146 හා 9 |
| *බටහිරට* | : | කොළඹ රත්නපුර පාර සහ කැබලි අංක 2 |

08-91


1A - G 19916— 05 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*